මහා මාර්ගෝපදේශ සංග්‍රහය



මෝටර් රථවාහන
දෙපාර්තමේන්තුව

මෝ. ප්‍ර. කො. 165

මහා මාර්ගෝපදේශ සංග්‍රහය

2008

CM 038856 - 40,000 (2023/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ප්‍රවාහන අමාත්‍යතුමාගේ පණිවුඩය

1951 මහා මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ නියෝගයන් ප්‍රසිද්ධ කිරීමේ අවස්ථාවේ සිට ශ්‍රී ලංකාවේ මෝටර් රථ වාහන ගමනාගමනය සැළකිය යුතු අන්දමින් වෙනස්කම්වලට භාජනය වී ඇත. එවක් පටන්, විශේෂයෙන් ම පසුගිය දස වසර තුළ දී ලියාපදිංචි කළ මෝටර්වාහන සංඛ්‍යාව සහ රියැදුරු බලපත්‍ර දරන්නන්ගේ සංඛ්‍යාව කිහිප ගුණයකින් අධික වී තිබේ. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ මහා මාර්ගයේ ආරක්ෂාව සහ රථ ගමනාගමන පාලනය යන ක්ෂේත්‍රයන්හි ලා මුහුණ පාන්නට වූ ගැටළුවල සංඛ්‍යාව සහ විවිධත්වය වැඩිවීමයි.

මහා මාර්ගයේ ආරක්ෂාව සහ රථ ගමනාගමන පාලනය, මෑතක දී, ජාත්‍යන්තර සංවිධානයන්ගේ මෙන් ම මෙරට රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානයන්ගේ පුළුල් අධ්‍යයනයට සහ පර්යේෂණයන්ට විෂයය විය. එබැවින් වර්තමානයේ පිළියෙළ කොට ඇති සංග්‍රහය, එම අධ්‍යයනයන්හි සහ පර්යේෂණයන්හි ප්‍රතිඵලයකි. එමගින් එය අපගේ මහා මාර්ගයන්හි පුළුල් විනයක් ඇති කිරීමට සහ මාර්ග අනතුරු සංඛ්‍යාව අඩු කරලීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මීට පෙර තිබූ මහා මාර්ගෝපදේශ සංග්‍රහය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් බොහෝ වාරයක් නැවත නැවත මුද්‍රණය කරන ලද බව සඳහන් කිරීම දිරිගන්වන සුළු ය.

මාර්ගයේ ආරක්ෂාවට අනුකූලවන මේ මාර්ගෝපදේශ සංග්‍රහයේ වැදගත්කම පිළිබඳ ව මහජනයා පූර්ණ අවබෝධයකින් යුතු ව සිටින බව පැහැදිලි ව පෙන්වීමට මෙය හොඳ සාධකයකි.

මාර්ගයේ අනතුරු වැළැක්වීමට සහ මාර්ගයේ තත්වය වැඩි දියුණු කරලනු පිණිස, සියලු දෙනා සහයෝග වී, රජය සමග සහයෝගීත්වයෙන් කටයුතු කිරීමට, මෙම මහා මාර්ගෝපදේශ සංග්‍රහය මැනැවින් අධ්‍යයනය කර, ඊට අනුකූලව කටයුතු කරන මෙන් මාර්ගය පාවිච්චි කරන සියළු දෙනාගෙන් ම උදක් ම ඉල්ලා සිටිමි.

අඩංගු කරුණු

අංකය

1. පාගාමීහු 5–13

2. පාපැදියන් 14–22

3. මෝටර් වාහන පදවන්නන් :
- සාමාන්‍ය 23–49
- මංසන්ධි 50–65
- අන් වාහන පසුකර යෑම 66–71
- වාහන නවත්වා තැබීම 72–77
- පසුපසට පැදවීම 78
- ආපදාවන් සහ හදිසි අනතුරු ... 79–85

රූපසටහන් අංකය

4. සංඥා සහ මාර්ග සළකුණු :
- අනතුරු හැඟවීමේ සංඥා... ... 01–34
- පාලන සංඥා :
  - (අ) තහනම් සංඥා 35–48
  - (ආ) අතිරේක පුවරු 49–53
  - (ඇ) සීමාකාරී සංඥා 54–59
  - (ඈ) විධාන සංඥා 60–66
  - (ඉ) ප්‍රමුඛතා සංඥා 67–73
- රියැදුරන්හට ප්‍රයෝජනවත් අනෙකුත් සංඥා 74–82
- මාර්ග මත පිහිටුවන සළකුණු ... 83–109

5. කොරතුරු සංඥා :
- මගපෙන්වීමේ පූර්ව සංඥා... ... 110–114
- මගපෙන්වීමේ සංඥා 115–116
- ස්ථාන හඳුනා ගැනීමේ සංඥා ... 117–118
- ස්ථිර කිරීමේ සංඥා 119

6. පදිකයන් සඳහා ආලෝක සංඥා 120–121

මහා මාර්ග නීති සංග්‍රහය

1. 1987 මාර්තු මස 13 වැනි දින රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි දක්වා ඇති මෝටර් රථ ප්‍රවාහන පනතේ අංක 237 දරන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයන් සහ සංඥාවන් සාමාන්‍ය ජනතාවගේ භාෂාවෙන් සකස් කොට පිළියෙළ කරන ලද සංක්ෂිප්ත එකතුවකි, මහා මාර්ගෝපදේශ සංග්‍රහය.

2. මහා මාර්ගය පාවිච්චි කරන්නා වූ —

   පාගාමීන් ;
   පාපැදිකරුවන් ; සහ
   මෝටර් වාහන පදවන්නන්

   වැනි පුද්ගලයන්ගේ මාර්ගෝපදේශකත්වය සඳහා යෝග්‍ය යැ'යි පෙනී යන නියමයන්ගෙන් එය සමන්විත වේ.

3. මෙම නියෝගයන් යටතේ දැක්වෙන රථ ගමනාගමන සංඥාවන්, පොත් පිංචෙහි අවසාන කොටසෙහි නියම කොට ඇති අතර, ඒවා අනතුරු හැඟවීමේ සංඥා, පාලන සංඥා සහ තොරතුරු සංඥා යනුවෙන් නම් කොට ඇති මාර්ග සංඥා සහ මාර්ග සළකුණුවලින් යුක්ත වේ.

4. මාර්ගය පාවිච්චි කරන සියලුදෙනා විසින් ආරක්ෂාකාරී ව සහ උපරිම අන්දමින් ඉතා අගනා මාර්ග ඉඩකඩ, පරිහරණය කිරීමට ඉවහල් වන සේ, හැසිරීමේ රීති පද්ධතියක් පිළිපදින බවට සහතික වනු පිණිස මෙම නියෝගයන් පිළියෙළ කොට තිබේ.

1. පාගාමීහු

5. ළමයින්ට මාර්ගයේ සෙල්ලම් කිරීමට ඉඩ නො දෙන්න. ළමයින් සමග පයින් ගමන් කරන විට, ඔවුන් ව නිතර ම රථධාවන පථයෙන් ඈත් ව රැගෙන යන්න. මාර්ගයේ ආරක්ෂාව පිළිබඳ ව ඔවුන්ට මුල් අවදියේ ම උගන්වා, සෑමවිට ම ඔවුන්ට හොඳ ආදර්ශයක් දෙන්න.

6. පැති මගක් හෝ අඩිපාරක් සපයා ඇත්නම්, නිතර ම එය පාවිච්චි කරන්න. පැති මගක් හෝ අඩිපාරක් නොමැති නම්, ඉදිරියෙන් එන රථ වාහනවලට මුහුණ ලා, මාර්ගයේ දකුණු පැත්තෙන් ගමන් කරන්න.

7. රථවාහන ගමනාගමනයට මාර්ගයේ හැකිතාක් දුරට ඉඩ දී වඩා සුදුසු පරිදි තනි තනි ව එකිනෙකා පසු පස ගමන් කරන්න. එක පෙළට දෙදෙනෙකුට වඩා සිටින සේ කිසිවිටක ගමන් නො කරන්න. පාගාමීන් මාරුවන ස්ථානවල දී හෝ පැතිමංවල දී හැර, පාගාමීන් විසින් රථ වාහන ගමනාගමනයට ඉඩදිය යුතු ය.

8. අඩිපාරක් සපයා නොමැති නම්, විශේෂයෙන් ම රාත්‍රී කාලයේ දී, ලා පැහැති ඇඳුමින් සැරසී හෝ සුදු පැහැති යමක් රැගෙන මාර්ගයේ ගමන් කරන්න. අඩු ආලෝකයෙන් යුත් අවස්ථාවල දී, ඔබ මාර්ගයේ සිටින බව රියැදුරන් හට වඩා හොඳින් දැකගත හැකිවනු ඇත.

9. මාර්ගයක් හරහා ගමන් කිරීමට ඔබට සිදුවේ නම්, පාගාමීන් මාරුවන ස්ථානයක් (83 වැනි සළකුණ) හෝ මඟී පාලමක් හෝ පොළව යටින් පිහිටි පාගාමීන්ගේ මාර්ගයක් තිබේ දැ යි සොයා බලන්න. ඔබ සිටින ස්ථානයේ සිට මීටර් පනහක් (50) ඇතුළත එකී ස්ථානයන්ගෙන් එකක් ඇත්නම් එම ස්ථානයක දී මාර්ගය හරහා ගමන් කළ යුතු ය. මාර්ගය හරහා යා යුත්තේ එකී මාරුවන ස්ථානයෙන් මිස, දඟර ඉරිවලින් පෙන්වා ඇති ප්‍රදේශය හරහා නොවේ.

10. එවැනි සළකුණු කරනු ලැබූ මාරුවන ස්ථානයක් නොමැති නම්, ඔබ මාර්ගය හරහා ගමන් කිරීමට පෙර, නතර වී රථ වාහන ගමන් කරන ආකාරය දෙස හොඳින් බලා රථ වාහන අතරතුර ආරක්ෂාකාරී ඉඩක් ලැබෙනතුරු සිටින්න. දකුණු පැත්ත බලන්න. වම් පැත්ත බලන්න. නැවත දකුණු පැත්ත බලා, ආරක්ෂා සහිත නම් කඩිනමින් කෙළින් ම මාර්ගය හරහා ගමන් කරන්න. නවතා ඇති වාහනයක් පිටුපසින් ම හෝ ඉදිරියෙන් ම මාර්ගය හරහා ගමන් නොකරන්න. මාර්ගයේ ආරක්ෂක වැටවල් පිහිටුවා ඇති ස්ථානවල දී මාර්ගය හරහා ගමන් කළ යුත්තේ ඒ සඳහා කපොලු සළසා ඇති ස්ථානවල දී පමණකි. එම ආරක්ෂක වැටවල්වලින් පැනීම හෝ ඒවාට පිටතින් ගමන් කිරීම හෝ නොකළ යුතු ය.

11. මංසන්ධියකින් හැරෙන ස්ථානයක දී පාගාමීන් සඳහා ඇති අඩිපාර පටුවිය හැකි නිසා හෝ එවැනි අඩිපාරක් කොහෙත් ම නැති විය හැකි නිසා ප්‍රවේශමෙන් ගමන් කළ යුතු ය. විශේෂයෙන් ම දිග වාහනයක් එම ස්ථානයෙන් හැරෙන වේලාවල්වල දී වඩාත් ප්‍රවේශම් විය යුතු ය.

12. පාගාමීන් මාරුවන ස්ථානයක දී (83 වැනි සළකුණ) ඔබ මාර්ගය හරහා ගමන් කිරීමට උත්සාහ කිරීමට පෙර, රියදුරුට ඔබ දැක ගැනීමටත් ඔබ මාර්ගය හරහා ගමන් කිරීමට පටන් ගැනීමට පෙර වාහනයේ වේගය අඩුකර, වාහනය නවතා ගැනීමටත්, සෑහෙන කාල වේලාවක් දිය යුතු ය. මාරුවන ස්ථානයට ඔබගේ පා තබා නොමැති නම්, ඔබ වෙනුවෙන් රියැදුරු රථය නැවැත්විය යුතු නොවේ. ආලෝකය අඩුනම් හෝ මාර්ගය තෙත් ව පවතී නම් වඩාත් ප්‍රවේශමකාරී වන්න.

13. රථවාහන ගමනාගමනය සහ පාගාමීන් යන දෙකොටස ම රථවාහන ආලෝක සංඥා මගින් පාලනය කරනු ලබන්නා වූ පාගාමීන් මාරුවන ස්ථානයක දී 'රතු පැහැති' මිනිසා සංඥාව (120 වැනි සළකුණ) පෙනෙන්නට තිබේ නම්, මාර්ගය හරහා ගමන් නො කරන්න. ක්‍රියා කරවන බොත්තම ඔබා 'කොළ පැහැති මිනිසා' සංඥාව (121 වැනි සළකුණ) දැල්වෙනතුරු නැවතී සිට, මාර්ගය හරහා ගමන් කරන්න. එසේ ගමන් කළ යුත්තේ ප්‍රවේශමිනි. මක්නිසා ද යත්, අලෝක සංඥාවලට ප්‍රතිචාරය දැක්වීමට රථවාහනවලට කාලය තිබිය යුතු බැවිනි. මඳ වේලාවකින් පසුව 'කොළ පැහැති මිනිසා' සංඥාවේ ආලෝකය ජ්වලනය වීමට (නිවෙන්නට සහ දැල්වෙන්නට) පටන් ගනු ඇත. ඉන් අදහස් වන්නේ, 'රතු පැහැති මිනිසා' සංඥාව නැවතත් ඉක්මනින් පෙනී යනු ඇති බව ය. 'කොළ පැහැති මිනිසා' සංඥාවෙහි ආලෝකය ජ්වලනය වේ නම්, මාර්ගය හරහා යෑම ආරම්භ නොකරන්න. එහෙත් ඔබ එවකටත්, මාර්ගය හරහා ගමන් කරමින් සිටිය දී එම ආලෝකය ජ්වලනයවීම සිදුවේ නම්, මාර්ගයේ අනෙක් පැත්තට යාමට ඔබට කාලය ඇත. එහෙත් ඔබ කඩිනමින් ගමන් කිරීම මැනවි.

(අ) බස්රථයක් තුලට ගොඩවීමට ඔබ බලාපොරොත්තු වන්නේ නම්, 78 සංඥාවෙන් හඳුන්වනු ලැබ ඇති, ළඟ ම පිහිටි බස්රථ නැවතුම කරා ගොස්, පෝලිමෙහි ඔබේ ස්ථානයෙහි සිටින්න. පෝලිම කඩාගෙන යාම වරදකි. ඔබ බස්රථය තුලට ගොඩවීමට හෝ බස්රථයෙන් බැසීමට පෙර බස්රථය, බස්රථ නැවතුමෙහි නතර කරන තුරු සිටින්න.

2. පාපැදියන්

14. මාර්ගයට පිවිසීමට ඔබ යෝග්‍ය තත්ත්වයෙන් සිටින්නේ දැයි, මැනැවින් දැනගන්න. ඔබගේ පාපැදිය යාන්ත්‍රික වශයෙන් හොඳ තත්ත්වයෙන් තිබේ දැ යි පරීක්ෂා කර බලන්න. එහි ආසනය සහ හැඬලයේ මිට, ඔබගේ නිවැරදි උසට සරිලන සේ පිහිටුවා ඇති බවටත්, වාර්ෂික බලපත්‍ර තහඩුව පැහැදිලි ව පෙනෙන ස්ථානයක සවිකර ඇති බවටත් පරීක්ෂාකාරී වන්න.

15. රාත්‍රී කාලයේ දී ඔබගේ පාපැදියෙහි ඉදිරිපසින් සුදු පැහැති ආලෝකයෙන් යුත් ලාම්පුවක් සහ පසුපසින් රතු පැහැති ආලෝකයෙන් යුත් ලාම්පුවක් හෝ රතු පැහැති පරාවර්තකයක් හෝ රැගෙන යායුතු ය. පරාවර්තකය අවම වශයෙන් සෙ. මී. 3.75 (අඟල් 1 1/2)ක විෂ්කම්භයෙන් යුක්ත විය යුතු ය. ඔබගේ පාපැදියේ පසුපස මඩවරණයෙහි (මඩ්ගාඩ්) පතුලේ සිට සෙ. මී. 23 (අඟල් 9)ක් උසට සුදු පැහැයෙන් පින්තාරු කළ යුතු ය. නිතර ම අඳුර වැටුණු විගස ම ඔබගේ ලාම්පු ක්‍රියාත්මක කරන්න. රාත්‍රී කාලයේ දී ඔබගේ ලාම්පු දල්වා තිබේ නම් සහ ඔබ ලා පැහැති ඇඳුම් ඇඳ සිටින්නේ නම්, ඔබ කරා ලඟාවන වාහනවලට ඔබ ව වඩා හොඳින් දැකගත හැකි වේ.

16. මාර්ගයේ පාපැදි ධාවන තීරුවක් සපයා ඇත්නම්, නිතර ම එය පාවිච්චි කරන්න. එහෙත් පාපැදි ධාවන තීරුවක් නොමැති නම්, මාර්ගයේ වම් පැත්තේ අයිනේ ගැටියට ආසන්න ව ගමන් කරන්න. නිතර ම තනි තනිව එකිනෙකා පසුපස මිස එක පෙළට දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සිටින සේ නොපදවන්න.

17. අතින් සංඥා දෙන විට හැර, නිතර ම ඔබගේ දෑත ම හැඬලය මත තබාගන්න. පාපැදිය හරවන විට ඔබේ අත් දෙක ම හැඬලය මත තබාගන්න. සංඥාවන් කල්වේලා ඇතිව දී අනෙකුත් වාහනවල වේගය පිළිබඳ ව සැලකිලිමත් වී, අවශ්‍ය පරිදි වාහනය හැසිරවීමට හැකි දැ යි මැනවින් දැන ගන්න. පා පැදිය නිසියාකාරව හසුරුවා ගැනීමෙහි ලා බාධාකාරී වන කිසිවක් රැගෙන නොයන්න.

18. පා පැදියක් පදවන විට ධාවනය කරමින් සිටින වෙනත් පා පැදිකරුවකු හෝ වෙනත් වාහනයක් අල්ලාගෙන නොපදවන්න.

19. රථවාහන අතරින් පතර එහා මෙහි රිංගා යන සේ නො පදවන්න. දඟර හැඩයකට පා පැදිය නොපදවන්න.

20. නවතා ඇති වාහනයක් පසුකර යන විට, එම වාහනය තුළ සිටින්නවුන්, අපරීක්ෂාකාරී ලෙස වාහනයේ දොරවල් විවෘත කරන්නේදැ'යි ප්‍රවේශම්වන්න. තව ද වඩා වේගයෙන් ගමන් කරන අනෙකුත් වාහන විසින් ඔබ සහ නවතා ඇති වාහනය පසු කරන්නේදැ'යි ප්‍රවේශම් වන්න.

21. කුඩා මාර්ගයක සිට ප්‍රධාන මාර්ගයකට පිවිසීමේ දී ඉතා ප්‍රවේශම්කාරී වන්න. නිතර ම ප්‍රධාන මාර්ගයට ඇතුළුවීමට පෙර ඔබගේ වාහනය නවත්වන්න. ප්‍රධාන මාර්ගයේ ගමන් කරන රථවාහනවලට ඉඩ දෙන්න.

22. එක් දිශාවකට පමණක් වාහන ගමන් කරන මාර්ගයක දී හෝ වටරවුමක දී රථවාහන ගමන් කරන දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාවට නොපදවන්න.

3. මෝටර් වාහන පදවන්නන්

සාමාන්‍ය

23. ඔබ යෝග්‍ය තත්ත්වයක පසුවේ නම් සහ මත්පැන් ගැනීමෙන්, මත්ද්‍රව්‍ය (ඖෂධ) පාවිච්චි කිරීමෙන්, විඩාවට පත්වීමෙන් හෝ චිත්තාවේගවලට ගොදුරුවීමෙන් තොර ව සිටින්නේ නම් මිස ගමනක් ආරම්භ නොකරන්න.

24. ඔබගේ වාහනය යහපත්, යාන්ත්‍රික තත්ත්වයේ තිබෙන බව මැනවින් දැනගන්න. වාහනයේ සුක්කානම් යන්ත්‍රය, තිරිංග, ටයර්, ලාම්පු, නලාව, වාමුවා පිස්නයන් (වයිපර්), සංඥා ආලෝක ආදිය පිළිබඳ ව විශේෂයෙන් අවධානය යොමු කරන්න. සැරසිලිවලින් හෝ ඒ සමාන අනවශ්‍ය දේවල් නිසා ඔබට මාර්ගය පෙනීම අවහිර නොවිය යුතු ය.

25. වලංගු රියැදුරු බලපත්‍රයක් සහ ආදායම් බලපත්‍රයක් ඔබ සතු ව තිබිය යුතු අතර, වාහනය අවම වශයෙන් තුන්වැනි පක්ෂයකට සිදුවන හානි සම්බන්ධයෙන් කරන ලද ආරක්ෂණ ඔප්පුවකින්වත් ආවරණය කර තිබිය යුතු ය.

26. ඔබ රිය පැදවීම පුහුණු වන්නේ නම්, එම පන්තියට අයත් වාහන පැදවීමට බලපත්‍රයක් ලත් රියැදුරෙක් ඔබට උපදෙස් දීමට සහ සහායවීම පිණිස ඔබගේ පසෙකින් වාඩි වී සිටිය යුතු ය.

27. ඔබගේ වාහනයේ ආසන පටි සවිකර තිබේනම්, ඒවා පාවිච්චි කරන්න. ඔබේ වාහනය හදිසි අනතුරකට භාජනය වුවහොත් නිවැරදි ව පැළඳගෙන සිටින ආසන පටි හේතුවෙන් ඔබට තුවාල සිදුවීම බොහෝ සෙයින් අඩුවනු ඇත. ඔබගේ දරුවා පසුපස ආසනයෙහි තබා රැගෙන යන්න. නිසි පරිදි සවිකරන ලද ළමා ආරක්ෂක පටියක් හෝ ආසනයක් මේ සඳහා වඩාත් යෝග්‍ය වේ. නිතර ම රියැදුරු ආසනය ඔබට ගැලපෙන පරිදි සකස් කරගන්න.

28. මෝටර් සයිකල් පදවන්නන් සහ ඒවායේ ගමන් කරන්නන් අනුමත ආරක්ෂක හිස්වැස්මක් පැළඳිය යුතු ය. සුදු පැහැති ආරක්ෂක හිස්වැස්මක් සහ ලා පැහැති ඇඳුමක් පැළඳීමෙන් දෘශ්‍යතාව අඩු වේලාවන් හි දී, ඔබ වඩාත් පැහැදිලි ව පෙනෙනු ඇත.

29. ගමන ආරම්භයට පෙර ඔබගේ ආසන පටි තදකර ගන්න. බැලුම් කන්නාඩියෙන් පසුපස බලා, ඔබගේ දකුණු උරහිසට ඉහළින්, පසුපස බලන්න. අවශ්‍ය නම් සංඥා දමා අනෙක් වාහනවල වේගය වෙනස් කිරීමට හෝ ගමන් මග වෙනස් කිරීමට හෝ සිදු නොවන අයුරින් ප්‍රවේශමින් ගමන ආරම්භ කළ හැකි නම් පමණක් ගමන ආරම්භ කරන්න.

30. අවදානම හැඟවීමේ ලාම්පු, පාවිච්චි කළ යුත්තේ ඔබගේ වාහනය අබල තත්ත්වයක පවත්නා බව හැඟවීමට පමණකි. ප්‍රමුඛත්වය දෙන ලෙස ඉල්ලා ඒවා පාවිච්චි නො කළ යුතු ය. ඒවා පාවිච්චි කළ යුත්තේ වාහනය ස්ථාවර ව නවතා තිබිය දී පමණකි.

ජ්වලනය වන (නිවෙන දැල්වෙන) ප්‍රධාන ලාම්පුවලින් හැඟවෙන්නේ ඔබ පැමිණෙන බව පමණි. ඒවා මගින් ඔබට ප්‍රමුඛත්වය නො ලැබේ.

31. මාර්ගයෙහි තත්ත්වය හා රථවාහන ගමනාගමන තත්ත්වය අනුව ප්‍රවේශම් සහිත වූ ද එම මාර්ගයෙහි ඔබගේ වාහනයට අදාළ වන්නා වූ ද වේග සීමාවට අනුකූලවන වේගයකින් වාහනය පදවන්න.

මාර්ගයේ ආරක්ෂාව පිණිස වේග සීමාවන් පනවා ඇත. වේග සීමා පිළිබඳ ව සාමාන්‍ය නියමයන් පහත දැක්වේ : —

වර්ගය	නාගරික ප්‍රදේශයන් ඇතුළත	නාගරික ප්‍රදේශවලින් පිටත
මෝටර් කාර්/ද්විත්ව කාර්ය මෝටර් සයිකල්	පැ. කි. මී. 50	පැ. කි. මී. 70
මෝටර් කෝච් මෝටර් ලොරි	පැ. කි. මී. 50	පැ. කි. මී. 60
මෝටර් ත්‍රීරෝද ත්‍රීරෝද වැන් රථ ඉඩම් වාහන වාෂ්ප බලයෙන් ධාවනය වන මෝටර් රථ	පැ. කි. මී. 40	පැ. කි. මී. 40

32. බාධාවකින් තොර ව ඔබට පැහැදිලි ව දැකිය හැකි දුර ප්‍රමාණය ඇතුළත වාහනය නවත්වා ගැනීමට හැකිවිය යුතු ය. නිතර ම නාගරික තද බද ප්‍රදේශයන් තුළ දී, වේගය අඩු කරන්න. ඉදිරියෙන් ගමන් කරන වාහන පසුපසින් ඒවාට ආසන්නව ම ගමන් නො කරන්න. ඔබට ඉදිරියෙන් ගමන් කරන රියැදුරා තම වාහනය හදිසියෙන් ම නතර කළහොත් ඔබගේ වාහනය ආරක්ෂා සහිත ව නවතා ගැනීමට හැකිවන සේ, ප්‍රමාණවත් දුරක් වාහන දෙක අතර තබාගත යුතු ය.

33. පාසල් (26 වැනි සළකුණ) පාගාමීන් මාරුවන ස්ථාන (74 වැනි සළකුණ) මංසන්ධි, තීව්‍ර වංගු, කඳුමුදුන්, අනාරක්ෂිත දුම්රිය හරස් පාරක් යන ස්ථානවලට ළඟා වීමේදීත්, මාර්ගය තෙත් ව ඇති විට හෝ දෘශ්‍යතාවය දුර්වල විට, විශේෂයෙන් ම ප්‍රවේශම් සහිත විය යුතු ය. අන්ධයන්ට සහ ආබාධිතයන්ටත් සුදු සැරයටියෙන් සහ මග පෙන්වන බල්ලන්ගෙන් පිහිට ලබන්නන්ටත් විශේෂයෙන් ඉඩ දෙන්න.



34. රියපැදවීමෙහිලා අත්‍යවශ්‍ය වෙනත් යම් කාර්යයන් කිරීමේ දී හැර නිතර ම අත් දෙක ම සුක්කානම හෝ හැඬලය මත තබාගත යුතු ය. එබඳු වෙනත් කාර්යයක් වුව ද කළ යුත්තේ එක් අතක් සුක්කානම මත තබාගෙන ය.

සංඥාවන් කල්වේලා ඇතිව දියයුතු අතර, හස්ත සංඥා පැහැදිලි ව සහ උනන්දුවෙන් දිය යුතු ය. වාහනයේ හැසිරවීමේ කාර්යය නිම වූ පසුව ජ්වලනය වන (නිවෙන දැල්වෙන) ආලෝක සංඥාව නවතා දැමීමට වග බලාගන්න.

35. වාහනයක වේගය සමග එය නැවැත්වීමේ දුර ප්‍රමාණයන් ද වැඩි වේ. ගමන් කරමින් තිබෙන වාහනයක් නැවතීමට පෙර බොහෝ දෙනෙක් සිතනවාට වඩා දුරක් එම වාහනය ගමන් කරයි. ප්‍රතික්‍රියා කාලය සහ සිතීමේ කාලය පහත ඇති රූපසටහනෙන් දැක් වේ.

නැවැත්වීමේ දුර



36. අන් අය ගැන නොසළකා, ආත්මාර්ථකාමී ව මාර්ගය පාවිච්චි කරන්නෙක් නොවන්න. වඩා වේගවත් ව ගමන් කරන වාහනවලට ඔබ පසුකර යාමට ඉඩ දෙන්න. සෙමින් ගමන් කරන විශාල පරිමානයේ වාහනවල රියැදුරන් විසින් වඩා වේගයෙන් ගමන් කරන වාහනවලට මාර්ගය ඉඩ දීමට සුදුසු අවස්ථාවක් ලද විගසම තම වේගය අඩු කළ යුතු ය. නැතහොත් වාහනය නැවැත්විය යුතු ය.

37. නළාව ශබ්ද කරමින් නළාවේ බලයෙන් ම වාහනය නොපදවන්න. බස්රථ සහ පාපැදි ධාවන තීරු වෙන්කර ඇත්තේ එම වාහනවල පාවිච්චිය සඳහා පමණි.

38. ඔබගේ ප්‍රධාන ලාම්පු අනවශ්‍ය අන්දමින් විශේෂයෙන් ම ආලෝකමත් කරන ලද ප්‍රදේශයන් තුළ දී, පාවිච්චි නොකරන්න. මාර්ගයේ දී අනෙකුත් වාහන හමුවන අවස්ථාවන්හි දී ඔබගේ ප්‍රධාන ලාම්පු අවපාත (ආලෝකය අඩු) කරන්න. පසුකර යාමට ඔබ අදහස් නොකරන වෙනත් වාහනයක් පසුපස ඒ ආසන්නයෙන් ම ඔබ ගමන් කරන විට ඔබගේ ප්‍රධාන ලාම්පු නිවා දමන්න. නැතහොත් අවපාත (ආලෝකය අඩු) කරන්න. ඔබගේ ප්‍රධාන ලාම්පුවල ආලෝකය අඩු කළ විට හෝ නිවා දැමූ විට විශේෂයෙන් ප්‍රවේශම්කාරී වන්න.

39. ඔබ කරා ළඟාවන වාහනයේ ප්‍රධාන ලාම්පුවලින් ඔබගේ ඇස් නිලංකාර වී ගිය විට ඔබගේ වේගය අඩු කරන්න. නැතහොත් වාහනය නවත්වන්න.

40. ධාවන තීරු පිළිබඳ රීති පිළිපදින්න. එමගින් රථවාහන ගමනාගමනය පහසුවෙන් සිදුවීමටත් ඉතා වටිනා ජාතික සම්පතකින් උපරිම ප්‍රයෝජනයක් ලැබීමටත් හේතුවනු ඇත.

41. ඔබට පාලනය කරගත නොහැකි කරුණු යටතේ හෝ, හදිසි අනතුරක් වැළැක්වීමට හෝ හැර ද්විත්ව සුදු පැහැති ඉරි (91 වැනි සළකුණ) හරහා ගමන් නොකළ යුතු ය.

42. දකුණු පැත්තට හැරවීමට හෝ හදිසි අනතුරක් වැළැක්වීමට හෝ හැර මාර්ගය මධ්‍යයේ හෝ ඒ ආසන්නයේ පිහිටි තනි නොකැඩුණු සුදු ඉර (90 වැනි සළකුණ) හරහා ගමන් නොකළ යුතු ය.

43. එක සමාන දුරස් ව පිහිටි සළකුණු සහිත (88 වැනි සළකුණ) හෝ බුබුළු සහිත (89 වැනි සලකුණ) කැඩුණු සුදු ඉරි මගින් මාර්ගයක එකිනෙක ප්‍රතිවිරුද්ධ දිසාවන්ට ගමන් කරන රථවාහන ධාවන පථයන් බෙදේ. ඔබට ඉදිරියෙන් එන යම් වාහනවලට බාධා නොවෙන්නේ නම් පමණක් එකී සළකුණුවලින් කුමන හෝ එකක් හරහා ඔබට ගමන් කළ හැකි ය.

44. දිග පරතරයක් ඇතිව කෙටි සුදු පැහැති සළකුණුවලින් ලකුණු කළ කැඩුණු සුදු ඉර (92 වැනි සළකුණ) ධාවන තීරයක සළකුණකි. මාර්ගයක් එසේ ධාවන තීරුවලට බෙදා සළකුණු කර තිබේ නම්, ඔබගේ වාහනය සම්පූර්ණයෙන් ම ඔබ ගමන් කරන ධාවන තීරය ඇතුළත ම තබාගන්න. ඔබ අඩු වේගයකින් ගමන් කරන්නේ නම් මාර්ගයේ අයිනට ආසන්න ධාවන තීරුවේ ගමන් කරන්න. ධාවන තීරුවෙ හි සළකුණ මැදි කොට සිටින සේ ධාවනය නොකරන්න. එක් ධාවන තීරුවකින් තවත් ධාවන තීරුවකට අනවශ්‍ය පරිදි මාරු නොවන්න. ඔබට එක් ධාවන තීරුවකින් තවත් ධාවන තීරුවකට මාරු වීමට අවශ්‍ය වේ නම් ප්‍රථමයෙන් ඔබගේ පසු බැලුම් කණ්නාඩිය බලා ප්‍රවේශම් සහිත වේ නම් අවශ්‍ය සංඥාව දමා අනෙක් ධාවන තීරුවට මාරු වන්න. එහි දී තම වේගය අඩු කිරීමට හෝ ගමන් මග වෙනස් කිරීමට හෝ අන් රියැදුරන් හට සිදුවන සේ ක්‍රියා නොකරන්න.

45. ඔබ ගමන් කරන මාර්ගයෙන් ඉවත් වීමට අදහස් කරන්නේ නම් සංඥාව දමා සුදුසු පිටවීමේ ධාවන තීරුවට කඩිනමින් පිවිසෙන්න. (100 වැනි සළකුණ) මාර්ග සළකුණුවලට හෝ වෙනත් යම් රථ ගමනාගමන සළකුණු හෝ සංඥා සපයා ඇති කුමන අවස්ථාවක දී හෝ ඒවාට කීකරුවන්න.

46. දිග සුදු ඉරි සළකුණු සහ කෙටි පරතරයන් සහිත සුදු කැඩුණු ඉර (106 වැනි සළකුණ) මගින් හැඟවෙන්නේ ඔබ රථ ගමනාගමනයෙ හි අවදානම් ස්ථානයකට ළඟාවන බව ය. වේගය අඩුකර අමතර පරීක්ෂාවෙන් යුතුව රිය පදවන්න.

47. ආරක්ෂා සහිත යයි ඔබ හොඳින් ම දන්නේ නම් මිස, හරස් විකර්ණ රේඛාවලින් සළකුණු කර ඇති (95 සහ 96 වැනි සළකුණු) අවදානම් කලාපයන්ට ඇතුළු නොවන්න. ඔබ රථ ගමනාගමන දූපතකට හෝ මංසන්දියකට ළඟාවන බව එකී හරස් විකර්ණ රේඛා සළකුණ මගින් හැඟවේ.

48. රථවාහන තදබද වී ඇති අවස්ථාවල දී ඉවසිලිමත් වන්න. පෝලිමෙන් පිට පැන ධාවනය නොකරන්න. එමගින් සිදුවන්නේ තදබදය උත්සන්නවීම පමණකි. ක්‍රමවත් ව ගමන් ගන්නා රථවාහන වඩා වේගවත් ව ඉදිරියට ඇදෙන අතර, අනතුරු සිදුවීම ද වළක්වයි.

49. මාර්ග සංඥාවෙන් (74 සළකුණ) සහ මාර්ග සළකුණෙන් (83 වැනි සළකුණ) හඟවන පාගාමීන් මාරුවන ස්ථානයක දී ඔබ මාර්ග සංඥාව (74 වැනි සළකුණ) ඉදිරියේ වාහනය නවතා ගැනීමට හැකිවන සේ වේගය අඩු කළ යුතු ය. පාගාමීන් මාරුවන ස්ථානයක දී පදිකයෙකු සිටීනම් එම සංඥාව ඉදිරියේ හෝ සුදු කළු ඉරි සහිත මාර්ග සළකුණෙ හි (83 වැනි සළකුණ) මාර්ගය "ඉඩදෙනු" රේඛාව ඉදිරියේ ඔබගේ වාහනය නැවැත්විය යුතුය. ඉන් පසුව එම මාරුවන ස්ථානය පාවිච්චි කරන පදිකයන්ගේ ආරක්ෂාව පිළිබඳව නිසි පරිදි සැළකිලිමත්ව ඉදිරියට ගමන් කළ යුතු ය.

මංසන්ධි

50. වාහන එකිනෙක ගැටීම් වැඩිම ප්‍රමාණයක් සිදුවන්නේ මංසන්දිවල දී හෝ මාර්ග බෙදී යන ස්ථානයන්හි දී බැවින් අනෙක් රථවාහන, පයින් ගමන් කරන්නන් සහ මංසන්දියෙන් හරවන වාහන ගැන විශේෂයෙන් සුපරීක්ෂාකාරී වන්න. ඉදිරියට පැදවීම ප්‍රවේසම් සහිත යයි ඔබ මැනවින් දැනගත් විට පමණක්, එසේ ගමන් කරන්න. වම් පැත්තට හෝ දකුණු පැත්තට හරවන වාහන විසින් කෙලින් ම ඉදිරියට ගමන් කරන වාහනවලට මාර්ගය ඉඩදිය යුතු ය.

51. ඔබ මංසන්දියකට ළඟාවීමට සෑහෙන වේලාවකට පෙර ඔබ ගමන් කළ යුතු මාර්ගය පිළිබඳව තීරණය කොට පසු බැලුම් කණ්නාඩිය බලා අවශ්‍ය නම් සංඥා දමා ඔබ ගමන් කරන දිසාවට උචිත ධාවන තීරුවට වාහනය යොමු කරන්න. ඊතලවලින් දැක්වෙන ධාවන තීරු සළකුණු සහ අනෙකුත් මාර්ග සළකුණු සහ සංඥාවන් අනුගමනය කරන්න. මංසන්දියක දී වාහන ගමන් කරන සාමාන්‍ය ක්‍රමය පහත දැක්වෙන අංක 1, 2 සහ 3 දරන රූප සටහන් මගින් දැක්වෙයි.



රූප සටහන 1



රූප සටහන 2



රූප සටහන 3

52. මාර්ගයේ කෙලින් ම ඉදිරියට යාමට ඔබ අදහස් කරන්නේ නම්, ඔබ මාර්ගයේ වම් පැත්තෙ හි රැඳී සිටිය යුතු ය. ඔබ ධාවන තීරු තුනකින්(3) යුත් මාර්ගයක ගමන් කරන්නේ නම්, මධ්‍යම ධාවන තීරුව පාවිච්චි කරන්න. මාර්ගයේ මධ්‍යයට වඩාත් ම ආසන්නම ධාවන තීරුව ඇත්තේ අන් වාහන පසුකර යන වාහන සහ දකුණු පැත්තට හරවන වාහන සඳහා ය. මාර්ගයේ අයිනේ ගැටියට ආසන්නතම ධාවන තීරුව ඇත්තේ සෙමින් ගමන් කරන වාහන සහ වම් පැත්තට හරවන වාහන සඳහා ය.

53. මංසන්ධියකට අවතීර්ණ වීමට පෙර එහි සපයා ඇති යම් රථ වාහන පාලන සංඥා ක්‍රමයක් මගින් දෙනු ලබන විධානයන් සහ අනෙකුත් මාර්ග නීති ද, අනුගමනය කර උචිත ධාවන තීරුවෙහි ඇති ඔබගේ පිටවීමේ මාර්ගය කරා මංසන්දිය හරහා ගමන් කරන්න.

54. වම් පැත්තට හැරවීමට පෙර කල් වේලා ඇතිව සංඥාව දෙන්න. ඔබගේ වම් පැත්තෙන් වෙනත් වාහනයක්, විශේෂයෙන් පාපැදිකරුවෙකු හෝ යතුරුපැදිකරුවෙකු ඔබේ වාහනය පසු නොකරන බව, ඔබගේ පසු බැලුම් කණ්නාඩියෙන් බලා හොඳින් දැනගෙන, ආරක්ෂා සහිත පරිදි හැකිතරම් මාර්ගයේ වම් පැත්ත ආසන්නයට ගමන් කරන්න. ඔබ වේලාසනින් මාර්ගයේ වම් පැත්තට මාරු වීමෙන් ඔබ වම් පැත්තට හැරවීමට අදහස් කරන බව, අනෙකුත් රථ වාහනවලට ස්ථිරව දැනගත හැකි ය. මාර්ගයේ පිහිටුවා ඇති ඊතල සළකුණුවලින් වම් පැත්තට හරවන වාහනවලට එක් ධාවන තීරුවකට වැඩි ප්‍රමාණයක් සපයා තිබිය හැකිය. සපයා ඇති යම් රථවාහන පාලන සංඥා ක්‍රමයක් මගින් දෙනු ලබන විධානයන් පිළිපදින්න. එවැනි පාලන සංඥා ක්‍රමයක් සපයා නොමැති නම්, අනෙකුත් මාර්ග නීති අනුගමනය කර, පිටවීමේ මාර්ගය කරා සුදුසු ධාවන තීරුවෙ හි ප්‍රවේශමින් ඉදිරියට ගමන් කරන්න.

55. දකුණු පැත්තට හැරවීමට පෙර, ඔබගේ පසු බැලුම් කණ්නාඩියෙන් බලා, පැහැදිලිව සංඥාව දක්වන්න. මාර්ගය ආරක්ෂා සහිත වූ විට, මාර්ගයේ මධ්‍යයේ සිට මදක් වම් පැත්තට සිටින සේ හෝ දකුණු පැත්තට හරවන වාහන සඳහා වෙන් කර ඇති ධාවන තීරුව තුළට හෝ පදවන්න. සපයා ඇති යම් රථවාහන පාලන සංඥා ක්‍රම මගින් දෙනු ලබන විධානයන් අනුගමනය කරන්න. ප්‍රතිවිරුද්ධ දිසාවට එන රථ වාහන අතර, ආරක්ෂාකාරී ඉඩක් ලැබෙන තුරු සිට ඔබගේ පිටවීමේ මාර්ගය කරා සුදුසු ධාවන තීරුවෙහි ඉදිරියට ගමන් කරන්න.

56. ඔබ ළඟා වෙමින් සිටින මංසන්ධිය යම් මාර්ග සංඥාවක් මගින් හඳුන්වා නොතිබේ නම් හෝ යම් මාර්ග සළකුණක් මගින් ලකුණු කර නොමැති නම් හෝ එය "T" හැඩයේ මංසන්ධියක් නොවේ නම් හෝ ඔබගේ වේගය අඩුකර එසේ නැතහොත් වාහනය නවත්වා ඔබගේ දකුණු පැත්තෙන් එන සියලු ම වාහනවලට මාර්ගය ඉඩ දිය යුතු ය. "T" හැඩයේ මංසන්ධියක දී, ඔබගේ වම් පැත්තෙන් සහ දකුණු පැත්තෙන් යන දෙපැත්තෙන් ම එන වාහනවලට ඉඩ දිය යුතු වේ.

57. මංසන්ධියෙහි "නවතිනු" මාර්ග සංඥාව (68 වැනි සළකුණු) සහ හරස් මාර්ග සලකුණු (85 වැනි හෝ 102 වැනි සළකුණ) සපයා තිබේ නම්, ඉන් අදහස් වන්නේ ඔබ ප්‍රධාන මාර්ගයකට ළඟා වෙමින් සිටින බවත්, ප්‍රධාන මාර්ගයට වඩා ආසන්නයෙන් ම පිහිටි මාර්ග සළකුණෙහි (85 වැනි සළකුණ) දැක්වෙන හරස් ඉරෙහි ඔබගේ වාහනය නැවැත්විය යුතු බවත් ය. එම හරස් ඉර දක්නට නොමැති නම්, ප්‍රධාන මාර්ගය අසළ ඔබගේ වාහනය නැවැත්විය යුතුය. ඉන් අනතුරුව, ඔබ ප්‍රධාන මාර්ගයෙ හි එන සියලු ම රථවාහනවලට ඉඩදීමෙන් පසු ප්‍රධාන මාර්ගයට ඇතුළු වන්න.

58. "මාර්ගය ඉඩදෙනු" මාර්ග සංඥාව (67 වැනි සළකුණ) සහ මාර්ග සළකුණක් (86 වැනි සළකුණ) මංසන්ධියේ යොදා ඇත්නම්, ඉන් අදහස් වන්නේ ඔබ ප්‍රධාන මාර්ගයකට ළඟා වෙමින් සිටින බවත්, එහි ප්‍රධාන මාර්ගයට වඩා ආසන්නයෙන් ම පිහිටි මාර්ග සළකුණ (86 වැනි සළකුණ) මගින් දැක්වෙන කැඩුණු ඉර දක්නට ඇත්නම් එම ඉර ඇති ස්ථානයේ දී, ප්‍රධාන මාර්ගයේ එන සියලු ම රථවාහනවලට මාර්ගය ඉඩ දිය යුතු බවත් ය. එම ඉර දක්නට නොමැති නම්, එසේ වුව ද ඔබ ප්‍රධාන මාර්ගයට ඇතුළුවීමට පෙර ප්‍රධාන මාර්ගයෙ හි එන සියළුම රථවාහනවලට මාර්ගය ඉඩ දිය යුතු ය.

59. මංසන්ධියෙහි මාර්ග සංඥාව (66 වැනි සළකුණ) සහ හරස් මාර්ග සළකුණක් (87 වැනි සළකුණ) සපයා තිබේ නම් ඉන් අදහස් වන්නේ ඔබ වටරවුමක් සහිත මංසන්ධියකට ළඟා වෙමින් සිටින බවය. මාර්ග සළකුණ (87 වැනි සළකුණ) ඇති ස්ථානයේ දී, එම "මාර්ගය ඉඩ දෙනු" සළකුණ අසළ දී හෝ එම සළකුණ දක්නට නොමැති නම් ඔබ මංසන්ධියට ඇතුළුවීමට පෙර හෝ ඔබගේ දකුණු පැත්තෙන් එන සියළුම රථවාහනවලට මාර්ගය ඉඩ දිය යුතු අතර, ඉන් අනතුරුව, ඔබ දක්ෂිණාවෘතව ගමන් කරමින් මධ්‍යම දූපතින් හැරී යා යුතුය. (51 වැනි නියෝගයේ දක්වා ඇති (2) වැනි රූප සටහන බලන්න.)

60. ඔබ ළඟාවෙමින් සිටින්නේ පොලිස් නිලධාරියකු විසින් හෝ රථවාහන හැසිරවීමේ ආලෝක සංඥා මගින් පාලනය කරනු ලබන මංසන්ධියකට බව හරස් නැවතුම් ඉර (84 වැනි සළකුණු) මගින් පෙන්නුම් කෙරේ. ඔබ ළඟාවෙමින් සිටින්නේ රථවාහන හැසිරවීමේ ආලෝක සංඥා මගින් පාලනය කරනු ලබන මංසන්ධියකට බව, මාර්ග සංඥාව (20 වැනි සළකුණ) මගින් පෙන්නුම් කෙරේ.

61. පොලිස් නිලධාරියා විසින් හෝ රථවාහන හැසිරවීමේ ආලෝක සංඥාව විසින් ඔබට නවතින ලෙස විධාන කරනු ලැබූ විට, හරස් රේඛාවකින් (84 වැනි සළකුණ) ඔබ්බට වාහනය නොපැදවිය යුතු ය. පොලිස් නිලධාරියකු විසින් හෝ රථවාහන හැසිරවීමේ ආලෝක සංඥා විසින් හෝ දෙනු ලබන විධානයන් ඔබ නිතරම පිළිපැදිය යුතුය. පොලිස් නිලධාරියකු නොසිටින අවස්ථාවේ දී හෝ ආලෝක සංඥාවන් එම අවස්ථාවේ දී ක්‍රියාත්මක නොවී පවතින්නේ නම් හෝ ඔබ හරස් නැවතුම් ඉර (84 වැනි සළකුණ) පිහිටි ස්ථානයේ දී වාහනය නවත්වා දකුණු පැත්තෙන් ළඟාවන සියලු ම වාහනවලට මාර්ගය ඉඩ දිය යුතු ය.

62. රථවාහන හැසිරවීමේ ආලෝක සංඥා මගින් මංසන්ධිය පාලනය කරනු ලැබේ නම් මාර්ග බෙදී යන ස්ථානයෙ හි යම් බාධකයක් හේතුවෙන් එම ස්ථානයෙන් ඔබට පිටවිය නොහැකිව තිබේ නම් කොළ පැහැති සංඥාව වැටී තිබිය දී ඉදිරියට ගමන් නොකරන්න. රතු සහ කහ පැහැති ආලෝක සංඥා එකවර පෙනෙන සේ වැටී තිබේ නම්, මංසන්ධියට ඇතුළු නොවන්න. ඊතලයෙන් දැක්වෙන දිසාවට ඉදිරියට ගමන් කිරීමට ඔබ අදහස් කරන්නේ නම් මිස, කොළ පැහැති ඊතලයෙන් පාලනය කරනු ලබන දිසා මාරු කිරීමේ දී ක්‍රම ක්‍රමයෙන් වෙනස් කෙරෙන ධාවන තීරුවට ඇතුළු නොවන්න.

63. හරස් රේඛාව (84 වැනි සළකුණ) දක්නට නොමැති නම්, පොලිස් නිලධාරියකු විසින් විධාන කරනු ලැබුවහොත් මාර්ග බෙදී යන ස්ථානයට ඇතුළුවීමට පෙර හෝ රථවාහන හැසිරවීමේ ආලෝක සංඥා මගින් විධාන කරනු ලැබුවහොත්, ඔබට මුහුණලා පිහිටි ආලෝක සංඥා ඉදිරිපිට දී හෝ ඔබගේ වාහනය නවතා ගත යුතු ය.

64. රථවාහන ගමනාගමනය හැසිරවීම පිණිස ආලෝක සංඥා පාවිච්චි කරනු ලබන අවස්ථාවන්හි දී –



(1) රතු පැහැය.– "නවත්වනු" රථ ධාවන පථයෙ හි නැවතුම් ඉරෙන් මෙපිට වාහනය නවතාගෙන සිටිය යුතු යයි අදහස් කෙරේ.



(2) රතු සහ කහ පැහැයන් .– දෙක ම එකවර පෙනෙන විට "නවත්වනු" එහෙත් කොළ පැහැති ආලෝකය වැටෙන විට පිටත්වීමට සූදානම් විය යුතුයයි අදහස් කෙරේ.



(3) කහ පැහැය.– "නවත්වනු" රතු පැහැති ආලෝකය වැටෙන්නට ආසන්නයි යනුවෙන් අදහස් කෙරේ.



(4) කොළ පැහැය.– කොළ පැහැති ආලෝකයට මුහුණ ලා තිබෙන වාහනවලට කෙලින් ම ඉදිරියට යාමට හෝ ආරක්ෂා සහිත නම්, වම් පැත්තට හෝ දකුණු පැත්තට හරවා යාමට හැකි බව අදහස් කෙරේ.



(5) කොළ පැහැති ඊතලය.– රතු පැහැති සංඥාව සමග පෙන්නුම් කෙරෙන විට ඊතලයෙන් දැක්වෙන දිශාවට පදවාගෙන යෑමට වාහනවලට අවසර ඇති බව අදහස් කෙරේ.



(6) ජ්වලනය වන (නිවෙන දැල්වෙන) කහ පැහැය.– මංසන්ධියේ රථවාහන ගමනාගමනය තාවකාලිකව සංඥා ආලෝකයන් මගින් පාලනය කරනු නොලබන බව අදහස් කෙරේ. එහි දී රථවාහන විසින් සාමාන්‍ය මංසන්ධියක දී අදාළ වන මාර්ග නීති අනුගමනය කළ යුතු ය.



(7) ජ්වලනය වන (නිවෙන දැල්වෙන) රතු පැහැති සංඥාව.– මාරුවෙන් මාරුවට ජ්වලනය වන රතු පැහැති ආලෝකයන්, දුම්රිය හරස් මාර්ග, ගිනි නිවන මධ්‍යස්ථාන ආදී ස්ථානවල සපයා ඇත. එම ආලෝකයන් ජ්වලනය වේ නම් ඔබගේ වාහනය 'නැවැත්විය' යුතු ය.

ඔබ විසින් ඉහත දැක්වෙන සංඥාවලට තරයේ ම කීකරු විය යුතු ය.

65. මාර්ග බෙදී යන ස්ථානයක කහ පැහැති මාර්ග සළකුණක් (108 සහ 109 වැනි සළකුණු) මගින් මංසන්ධි කොටුවක් ලකුණු කර තිබේ නම් ඔබගේ පිටවීමේ මාර්ගය පැහැදිලි ව ඇත්නම් මිස, එම කොටුවට ඇතුළු නොවිය යුතු ය. ඔබට මංසන්ධි කොටුව තුළ රැඳී සිටිය හැක්කේ ඔබ දකුණට හැරවීමට අදහස් කරන්නේ නම් සහ ඉදිරියට එන වාහනවලින් හෝ දකුණට හැරවීමට අදහස් කොට ගෙන නවතාගෙන සිටින වාහනවලින් ඔබට දකුණට හැරවීමට බාධා වන්නේ නම් පමණි.

අන් වාහන පසුකර යාම

66. අනෙකුත් වාහන ගමනාගමනයට බාධා නොවන සේ ද, ඔබට හෝ අනෙක් අයට අනතුරක් නොවන සේ ද, අන් වාහන පසුකර යා හැකි නම් මිස අන් වාහන පසුකර නොයන්න. රාත්‍රි කාලයේ දී සහ බෙහෙවින් වර්ෂාව සහ මීදුම ඇති විට දී විශේෂයෙන් ප්‍රවේසම් වන්න. ඔබගේ වාහනය ආරක්ෂිතව හැසිරවිය හැකි බව සැක සහිත නම් අන් වාහන පසු නොකොට ඒවා පසුපසින් ගමන් කරන්න.

67. ඔබ අන් වාහනයක් පසු කර යෑම ආරම්භ කිරීමට පෙර ඉදිරියෙන් ඇති මාර්ගය පැහැදිලිව පෙනෙන බවත් අවහිරයකින් තොර බවත් ඔබට ඉදිරියෙන් ඇති පැහැදිලි මාර්ගය ඇතුළත දී අනෙක් වාහනය සම්පූර්ණයෙන් ම පසුකර යා හැකි බවත් නිසැකව දැනගන්න. ඔබ විසින් වාහනය හැසිරවීම පිළිබඳ ආරක්ෂාව පිණිස, පසු බැලුම් කණ්නාඩිය බලන්න. අනෙක් වාහනය පසුකර යාමට තීරණය කළ විට එම අදහස ඔබගේ දකුණට හැරවීමේ සංඥාව දීමෙන් පැහැදිලිව ඉදිරිපත් කොට, එම වාහනය පසුකර ඉක්මණින් ගමන් කරන්න.

68. ඔබ වාහනයක් පසු කළ සැනෙත් ම එම වාහනයේ ගමනට අවහිර වන සේ එය ඉදිරිපසින් ම එහි ධාවන තීරුවට අවතීර්ණ නොවන්න. තවද, එම වාහනයට අයත් ධාවන මාර්ගයෙන් රියදුරුට ඉවත්වීමට සිදුවන සේ නොපදවා ආරක්ෂා සහිත වූ වහාම වම් පැත්තට පිවිසෙන්න. නැතහොත් සුදුසු ධාවන තීරුවට ඇතුළු වන්න.

69. ඔබට ඉදිරියෙන් ගමන් කරන වාහනය දකුණු පැත්තට හරවන බවට සංඥා කොට ඇති විට සහ වම් පැත්තෙන් පසුකර යෑම ආරක්ෂා සහිත යයි හැඟෙන අවස්ථාවන්හි දී හැර, නිතර ම දකුණු පැත්තෙන් අනෙක් වාහන පසු කර යන්න.

70. පහත සඳහන් ස්ථානවල දී හෝ ඒවාට ළඟා වීමේ දී අන් වාහන පසුකර නොයා යුතු ය :—

- තීව්‍ර කෝණයක් හෝ වංගුවක් ;
- කඳු මුදුනක් හෝ දුනු හැඩය ඇති පාලමක් ;
- මංසන්ධියක් ;
- පා ගාමීන් මාරුවන ස්ථානයක් ;
- "ඉස්සර නොකරනු" ප්‍රදේශයක් ;
- පදිකයන් සහ රථවාහන ගමනාගමනය විශාල ප්‍රමාණයකින් යුත් නාගරික ප්‍රදේශයක් ;
- මාර්ගය පටු කොටසක්.

තව ද, තනි හෝ ද්විත්ව සුදු ඉරි නොකැපෙන ලෙස අන් වාහන පසුකර යන්න.

71. අන් වාහනයක් විසින් ඔබේ වාහනය පසුකර යන විට, ඔබගේ වේගය වැඩි නො කරන්න. පසුකර යන්නාට කඩිනමින් ගමන් කරන්නට අයින් වී ඉඩ දෙන්න.

වාහන නවත්වා තැබීම

72. ඔබගේ වාහනය නවත්වා තැබීමට බලාපොරොත්තු වන සෑම විටක දී ම, ඔබට හැකිනම් වාහනය මාර්ගයෙන් ඉවත් ව සිටින සේ හෝ වෙන් කරන ලද වාහන නවත්වන ස්ථානයක හෝ නවත්වා තබන්න. රථවාහන බහුල මාර්ගවල වාහනය නවතා තැබීමෙන් වළකින්න. රථ ධාවන මාර්ගයෙහි වාහනය නැවැත්වීමට ඔබට සිදුවේ නම්, වාහනය මාර්ගයේ වම් පැත්තේ අයිනට හැකිතාක් ආසන්න ව, ඊට සමාන්තරව රථවාහන ගමන් කරන දිසාවට මුහුණ ලා සිටින සේ නවත්වන්න. අන් අයට සිදුවන අපහසුතාවය අවම වන ආකාරයට වාහනය නවත්වන්න.

73. වඩා යෝග්‍ය වාහන නැවැත්වීමේ ස්ථානයක් මාර්ග සංඥාව (77 වැනි සළකුණ) මගින් දැක්වේ. කෝණාකාරව සිටිනාසේ වාහන නවතා තැබිය යුතුයයි මාර්ග සළකුණුවලින් දැක්වේ නම්, ඒ ආකාරයට නැවැත්වීමට සිදුවිය හැකි ය.

74. ඔබ වාහනය නැවැත්වූ පසු, නවතා තැබීමේ තිරිංග අගුල් ස්ථිරව දමා, එන්ජිම ක්‍රියා විරහිත කරන්න. කිසිවකුගේ භාරයේ නොතබා වාහනය දමා යාමට ඔබ අදහස් කරන්නේ නම්, හැකිතරම් සුරක්ෂිත ලෙස අගුල් දමා තබන්න. රථ නැවැත්වීම සඳහා ඇති ස්ථානයක, ඔබගේ වාහනය ක්‍රමවත් පිළිවෙළක ට අනුව නවතා තබන්න.

75. පහත දැක්වෙන ස්ථානවල දී ද වාහන නවත්වා නොතැබිය යුතු ය :—

- වංගුවකදී, කඳු මුදුනකදී, පාලමක් මත දී ;
- මාර්ගය පටුවන ස්ථානයක දී හෝ මාර්ගයට අයත් අංගෝපාංගයක් හෝ වෙනත් යම් වාහනයක් හෝ ද්‍රව්‍යක් නිසා මාර්ගයෙහි ඇති පළල ප්‍රමාණය අඩුවන ස්ථානයක දී ;
- තනි හෝ ද්විත්ව සුදු ඉරි ඇතුළුවන මාර්ග සළකුණු පිහිටුවා ඇති ස්ථානවල දී ;
- පදික වේදිකාවක් මත ;
- බස්රථ ධාවන තීරුවක, පාපැදි ධාවන තීරුවක හෝ කුලී කාර් නැවතුම් පොලක ;
- බස්රථ නැවතුමක සිට මීටර් 30ක දුර ප්‍රමාණයක් ඇතුළත දී ;
- ගිනි නිවන ජල නලයක සිට මීටර් 15ක දුර ප්‍රමාණයක් ඇතුළත දී ;
- මංසන්ධියක සිට මීටර් 25ක දුර ප්‍රමාණයක් ඇතුළත දී ;
- පා ගාමීන් මාරුවන ස්ථානයක, දඟර ප්‍රදේශය හෝ එහි සිට මීටර් 15 ක ඇතුළත දී ;
- අධිවේග ධාවන තීරුවක් මත දී ;
- යම් ස්ථානයක ට ඇතුළුවීමේ දොරටුවක් හෝ ඉන් පිටවීමේ දොරටුවක් අසල දී.

76. රාත්‍රි කාලයේ දී නිතර ම රථවාහන ගමන් කරන දිශාව ට මුහුණලා සිටින සේ වාහනය නවතන්න. ඔබ වාහනය නවත්වන්නේ ප්‍රධාන මාර්ගයක නම්, ඔබගේ නැවතුම් පහන් දල්වා තබන්න.

77. වාහන නවත්වා තැබීම තහනම් කෙරෙන හෝ සීමා කෙරෙන සංඥාවන් අංක 45, 46, 47, 48 සහ 94 වැනි මාර්ග සළකුණු ලෙස උපලේඛනයේ දක්වා ඇත. මාර්ග සංඥා 51, 52 සහ 53 මගින් අදාල සංඥාවලින් ආවරණය කෙරෙන දිශාව, ප්‍රදේශය සහ සීමාව දැක්වේ. සැමවිට ම මේ උපදෙස් පිළිපැදිය යුතු ය.

පසුපසට පැදවීම

78. වාහනය පසුපසට පැදවීමේදී, ඔබගේ පෙනීම අඩ වශයෙන් අවහිර වන බැවින්, විශේෂයෙන් ම ප්‍රවේසම් වන්න. සුළු මාර්ගයක සිට ප්‍රධාන මාර්ගය කරා, කිසිවිටක පසුපසට නොපදවන්න. එමෙන් ම අවශ්‍ය ම ප්‍රමාණයට වඩා වැඩි දුරක් පසුපසට නොපදවන්න.

ආපදාවන් සහ හදිසි අනතුරු

79. ඔබගේ වාහනය ආපදාවකට හෝ හදිසි අනතුරකට භාජනය වුවහොත්, එය හැකිතරම් ඉක්මණින් මාර්ගයෙන් ඉවතට ගන්න. ඔබ හදිසි අනතුරකට භාජනය වූයේ නම්, මාර්ගයේ බාධකය මගහැරවීම පිණිස වාහනය ඉවත් කිරීමට පෙර, වාහනය පිහිටි ආකාරය පිළිබඳ ව සළකුණු කිරීම උචිත ය.

80. ඔබගේ වාහනය මාර්ගයෙන් ඉවතට ගත නොහැකි බව හෝ ඔබගේ වාහනය අනෙක් වාහනවල ගමනාගමනය ට අවදානමක් බව පෙනී ගියහොත්, වාහනයේ ඇති නවතා තැබීමේ ලාම්පු හෝ වාහනයට අවදානම හැඟවීමේ ලාම්පු සවිකර තිබේ නම් එම ලාම්පු හෝ දල්වන්න. වාහනයේ සිට මීටර් 50ක් පිටුපසින් වාහනය කරා ලඟාවන රථවාහනවලට මුහුණලා, අවදානම හැඟවීමේ උපකරණයක් (රතු පැහැති පරාවර්තනය වන ත්‍රිකෝණයක්) තබන්න. එම ස්ථානයෙහි මාර්ගය පටු නම්, ඔබගේ වාහනයේ සිට මීටර් 50ක් ඉදිරිපසින් වාහනය කරා ඉදිරියට එන රථවාහනවල ට මුහුණලා තවත් අවදානම හැඟවීමේ උපකරණයක් තබන්න. රාත්‍රියේ දී ඔබගේ වාහනයේ නවතා තැබීමේ ලාම්පු හෝ අවදානම හැඟවීමේ ලාම්පු දල්වා තබන්න.

81. වාහනය ආපදාව ට පත්වූයේ හෝ හදිසි අනතුර ට භාජනය වූයේ රථ ධාවන මාර්ගයේ දී නම්, අනෙකුත් රථවාහන පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් වන්න. එවැනි අවස්ථාවක දී, බාධකය ඇති ස්ථානයට මීටර් 150ක් ඉදිරියෙන් අවදානම හැඟවීමේ උපකරණය තබන්න. බාධකය එම ස්ථානයෙන් හැකි පමණ වේලාසනින් ඉවත් කිරීමට සෑම උත්සාහයක් ම දරන්න.

82. ඔබ ගමන් කරන වාහනය හදිසි අනතුරකට භාජනය වුවහොත්, එම වාහනයේ පදවන්නා වශයෙන් ඔබ–

(අ) වාහනය වහා ම නවත්වන්න.

(ආ) ඔබගේ නම සහ ලිපිනය, වාහනයේ අයිතිකරුගේ නම සහ ලිපිනය සහ වාහනයේ හැඳින්වීමේ අංකය යනා දී විස්තර පහත දැක්වෙන කවරකු විසින් හෝ ඉල්ලා සිටිය හොත් දෙන්න :–

(i) යම් පොලිස් නිලධාරියකු හෝ ග්‍රාමසේවක නිලධාරියකු.

(ii) තුවාල ලබා සිටින ඕනෑ ම පුද්ගලයකු ; හෝ

(iii) තුවාල හෝ අලාභහානි සිදුවූ සත්ත්වයා හෝ දේපල අයිතිකරු හෝ භාරව සිටින යම් පුද්ගලයකු.

(ඇ) තුවාල ලැබූ පුද්ගලයකු විසින් ඉල්ලා සිටියහොත්, හෝ ඔහු සිහි නොමැති ව සිටියි නම් හෝ අනතුරෙහි ප්‍රතිඵල වශයෙන් තුවාල ලැබූ පුද්ගලයාගේ ජීවිතය අන්තරාදායක තත්ත්වයක ඇති බව ඔබට හැඟේ නම් හෝ වහාම ළඟ ම ඇති රෝහල ට ඔහු රැගෙන යන්න.

(ඈ) තුවාල ලැබූ පුද්ගලයා රෝහලට ගෙනයාම සම්බන්ධයෙන් සිදුවිය හැකි ප්‍රමාදයන් හැර, අප්‍රමාද ව අනතුර පිළිබඳ ව ළඟ ම ඇති පොලිස් ස්ථානයට දන්වන්න.

(ඉ) යම් පුද්ගලයකු හට තුවාල සිදුවී ඇති අවස්ථාවක දී, පොලිස් නිලධාරියකු හෝ ග්‍රාමසේවා නිලධාරියා හෝ තුවාල ලැබූ පුද්ගලයා හෝ තුවාල ලැබූ පුද්ගලයා වෙනුවෙන් ක්‍රියාකරන පුද්ගලයකු හෝ ඉල්ලා සිටි විට, රක්ෂණ සහතිකය හෝ ඇප සහතිකය ඉදිරිපත් කරන්න. එසේ කිරීමට ඔබ අසමත් වුවහොත්, හැකිතාක් අප්‍රමාද ව, එය ළඟ ම ඇති පොලිස් ස්ථානය ට ඉදිරිපත් කරන්න.

83. අනතුරකට භාජනය වූ මෝටර් වාහනයේ අයිතිකරු ඔබ නම්, අනතුර සිදුවූ වේලාවෙහි ඔබ එහි සිටිය ද, නොසිටිය ද, ඕනෑ ම පොලිස් නිලධාරියකු හෝ ග්‍රාමසේවක නිලධාරියා විසින් ඉල්ලා සිටිය විට, ඔබ සතු ව පවත්නා වාහනයේ රියදුරුගේ නම, ලිපිනය, විස්තර, පූර්ව තොරතුරු, පදිංචි ස්ථානය, ආදී සියලුම කරුණු ඉදිරිපත් කළ යුතු ය. අනතුර සිදුවූ අවස්ථාවේ දී වාහනයේ සිටි සෑම පුද්ගලයකු පිළිබඳ ව ඉහත කී තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.

84. ඔබ ගමන් කරමින් සිටි මෝටර් වාහනය අනතුරකට භාජනය වුවහොත් –

(අ) ඔබගේ නම සහ ලිපිනය ;

(ආ) වාහනයේ රියදුරාගේ නම සහ ලිපිනය ;

(ඇ) වාහනයේ අයිතිකරුගේ නම සහ ලිපිනය ; සහ

(ඈ) වාහනයේ හැඳින්වීමේ අංකය

පහත සඳහන් අයෙකු ඉල්ලා සිටියහොත් දිය යුතු ය :–

(i) යම් පොලිස් නිලධාරියකු හෝ ග්‍රාමසේවා නිලධාරි ;

(ii) තුවාල ලබා සිටින යම් පුද්ගලයකු ; හෝ

(iii) තුවාල හෝ අලාභහානි සිදුවූ සත්ත්වයා හෝ දේපල අයිතිකරු හෝ භාර ව සිටින යම් පුද්ගලයකු.

85. තව ද, ඔබගේ නම සහ ලිපිනය ද, අනතුර සිදුවූ අවස්ථාවේ දී ඔබ වාහනයෙහි සිටි බව ද, ළඟ ම පිහිටි පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරිට අප්‍රමාද ව දැන්විය යුතු ය.

4. සංඥා සහ මාර්ග සළකුණු

උපලේඛනය



නවතිනු.



ඉදිරියට එන්න.

ඉදිරියෙන් සහ පිටුපසින් එන වාහන නතර වෙනු.

ඉදිරියට එන්න.



පිටුපසින් එන වාහන නතර වෙනු.

අනතුරු හැඟවීමේ සංඥා

1
වම් පැත්තට
වංගුව ඉදිරියෙනි.

2
දකුණු පැත්තට වංගුව
ඉදිරියෙනි.

3
වම් පැත්තට ද්විත්ව
වංගුව ඉදිරියෙනි.



4
දකුණු පැත්තට
ද්විත්ව
වංගුව ඉදිරියෙනි.



5
දකුණු පැත්තට
වැලමිටි වංගුව
ඉදිරියෙනි.



6
වම් පැත්තට
වැලමිටි වංගුව
ඉදිරියෙනි.

7
ද්විත්ව රථ මාර්ගය
අවසානය ඉදිරියෙනි.



8
ඉදිරියෙහි දී
මාර්ගය පටුය.



9
එකිනෙක හරහා
ගමන් කරන
මාර්ගය ඉදිරියෙනි.

10
පළමුවැනි පැති
මාර්ගය
වම් පැත්තට විහිදෙන
විසම සන්ධිය
ඉදිරියෙනි.



11
පළමුවැනි පැති
මාර්ගය දකුණු පැත්තට
විහිදෙන විසම
සන්ධිය ඉදිරියෙනි.



12
T හැඩයේ මංසන්ධිය
ඉදිරියෙනි.

13
Y හැඩයේ
මංසන්ධිය ඉදිරියෙනි.



14
වම් පැත්තෙන්
රථවාහන ප්‍රධාන
මාර්ගයට එක්වන
සන්ධිය ඉදිරියෙනි.



15
දකුණු පැත්තෙන්
රථවාහන ප්‍රධාන
මාර්ගයට එක්වන
සන්ධිය ඉදිරියෙනි.



16
පටු පාලම
ඉදිරියෙනි.

17
ඉදිරියෙන් නවතිනු.



18
ඉදිරියෙන් මාර්ගය
ඉඩ දෙනු.

19
වට රවුම ඉදිරියෙනි.



20
රථ වාහන ආලෝක
සංඥා ඉදිරියෙනි.

21
පහතට අවදානම්
බෑවුම ඉදිරියෙනි.

22
ඉහළට අවදානම්
බෑවුම ඉදිරියෙනි.

23
ලිස්සන සුළු
මාර්ගය ඉදිරියෙනි.

24
ගල් පර්වත කැබලි
වැටෙන ස්ථානය
ඉදිරියෙනි.

25
පදිකයන් මාරුවන
ස්ථානය ඉදිරියෙනි.

26
ළමයින් මාරුවන
ස්ථානය ඉදිරියෙනි.

27
මිනිසුන් වැඩෙහි
යෙදෙන ස්ථානය ඉදිරියෙනි.



28
ගේට්ටු සහිත දුම්රිය
හරස් මාර්ගය ඉදිරියෙනි.

29
ආරක්‍ෂා කර
නොමැති
දුම්රිය හරස්
මාර්ගය ඉදිරියෙනි.



30
බස් රථ ධාවන
තීරුව ඉදිරියෙනි.

31
පාපැදි ධාවන
තීරුව ඉදිරියෙනි.

32
පාපැදිකරුවන් මාරුවන
ස්ථානය ඉදිරියෙනි.

33
ගවයන් හෝ වෙනත් සතුන්
මාර්ගය හරහා ගමන් කිරීමට
ඉඩ ඇති ස්ථානය ඉදිරියෙනි.

34
මාර්ගය පැත්තකින් පිහිටි
ජලාශයකට බෑවුම්
වන ස්ථානය ඉදිරියෙනි.

පාලන සංඥා

(අ) තහනම් සංඥා

35
ඇතුල්වීම තහනම්

36
වම් පැත්තට
හැරවීම තහනම්

37
දකුණු පැත්තට
හැරවීම තහනම්

38
U හැඩයට සිටින සේ
හැරවීම තහනම්



39
වාහන ඉස්සර
කිරීම තහනම්

40
නලා ශබ්ද
කිරීම තහනම්



41
මාර්ගය වසා ඇත

42
බස්රථ සඳහා
මාර්ගය වසා ඇත

43
ලොරි සඳහා
මාර්ගය වසා ඇත

44
සියළුම වාහන සඳහා
මාර්ගය වසා ඇත

45
වාහන
නැවැත්වීම තහනම්

46
වාහන නැවැත්වීම සහ
රැඳවීම තහනම්



47
ඔත්තේ දිනවල
වාහන නැවැත්වීම
තහනම්

48
ඉරට්ටේ දිනවල
වාහන නැවැත්වීම
තහනම්

(ආ) අතිරේක පුවරු



49



50



51



52



53

(ඇ) සීමාකාරී සංඥා



54
පළල සීමාව



55
උස සීමාව



56
බර සීමාව



57
ඇක්සලයක් මත
නියමිත බර සීමාව



58
වේග සීමාව



59
වේග සීමාවෙහි
අවසානය

(ඇ) විධාන සංඥා



60
වම් පැත්ත ට
හැරවිය යුතු ය.



61
දකුණු පැත්ත ට
හැරවිය යුතු ය.

62
කෙළින්ම ඉදිරිය ට
ගමන් කළ යුතු ය.



63
ඉදිරියෙන් වම් පැත්ත ට
හැරවිය යුතු ය.



64
ඉදිරියෙන් දකුණු
පැත්තට හැරවිය
යුතු ය.



65
මේ පැත්තෙන්
පසු කරන්න.



66
අනිවාර්ය
වට රවුම

(ඉ) ප්‍රමුඛතා සංඥා



67
මාර්ගය ඉඩදෙනු

68
නවතිනු



69
ආරක්‍ෂාකර නොමැති
දුම්රිය හරස් මාර්ගය



70
ප්‍රමුඛතා මාර්ගය



71
ප්‍රමුඛතාවය
අවසන් වේ.



72
ඉදිරියෙන් එන
වාහනවලට
ප්‍රමුඛත්වය දිය යුතු ය.



73
ඉදිරියට යන
වාහනවලට
ප්‍රමුඛත්වය
දිය යුතු ය.

රියැදුරන්හට ප්‍රයෝජනවත් අනෙකුත් සංඥා



74
පදිකයන් මාරුවන
ස්ථානය



75
තනි අතට
ගමන් කරන
මාර්ගය



76
රෝහල

77
වාහන නවත්වන
ස්ථානය



78
බස් රථ
නැවතුම



79
බස් රථ සඳහා පමණක් ඇති ධාවන තීරුව
ආරම්භය හෝ ඉදිරියට පැතිරීම



80
බස් රථ සඳහා පමණක්
ඇති ධාවන තීරුව අවසානය.



81
පාපැදි සඳහා පමණක්
ඇති ධාවන තීරුව
ආරම්භය හෝ
ඉදිරියට පැතිරීම



82
පාපැදි සඳහා පමණක්
ඇති ධාවන
තීරුව අවසානය

මාර්ගය මත පිහිටුවන සළකුණු

පදිකයන් මාරුවන ස්ථානය



83

සීබ්‍රා ඉරි මගින් පාලනය වන ප්‍රදේශ



84

රථ වාහන ආලෝක සංඥා හෝ පොලීසිය මගින් පාලනය කරනු ලබන මාර්ග බෙදීයන ස්ථානයක පිහිටුවන නැවතුම් රේඛාව



85

නවතිනු ! සංඥාවෙහි පිහිටුවන නැවතුම් රේඛාව



86

මාර්ගය ඉඩ දෙනු රේඛාව



87

වට රවුමක පිහිටුවන "මාර්ගය ඉඩ දෙනු" රේඛාව

88

මධ්‍ය රේඛාව
සළකුණු කිරීම

89

මාර්ග සළකුණු
බුබුළු යොදා
මාර්ගයේ මධ්‍ය
රේඛාව සළකුණු
කිරීම

90

දකුණට හැරීම පිණිස
හැර, මාර්ගය හරහා
ගමන් කිරීමට
තහනම් කෙරෙන
ආයත රේඛාව

91

මාර්ගය හරහා
ගමන් කිරීම
තහනම් කිරීමේ
ආයත රේඛාව

92

ධාවන තීරු
සළකුණ



93

වංගුවක දී ධාවන
පථයේ අයින දැක්වීමට
පිහිටුවන ආයත රේඛාව



94

රථ වාහන
ගාල් කිරීම
තහනම් කර ඇති
බව හෝ සීමාකර ඇති
බව දැක්වීමට ධාවන පථයේ
අයින දිගේ පිහිටුවන රේඛාව

අවදානම් ප්‍රදේශ



95
(ඉදිරිපසින්
එන රථවාහන)



96
(එම දිශාවටම
යන රථවාහන)

97
අනිවාර්යයෙන්ම වමට හැරවිය
යුතු බවට රථවාහනවලට
දැක්වීමට යොදා ඇති සළකුණ



98
අනිවාර්යයෙන් ම
දකුණට හැරවිය යුතු
බවට රථවාහනවලට
දැක්වීමට යොදා
ඇති සළකුණ

99
අනිවාර්යයෙන් ම
කෙළින්ම ඉදිරියට ගමන්
කළයුතු බවට රථ වාහනවලට
දැක්වීමට යොදා
ඇති සළකුණ



100
සුදුසු රථ ධාවන තීරයන්
වාහනවලට දැක්වීමට
යොදා ඇති සළකුණු

SLOW

101
ඉදිරියෙන් විභව අවදානමක් ඇති බවට දැක්වීමට යොදා ඇති සළකුණ

STOP

102
“නවතිනු” සංඥාව 68 සහ 85 මාර්ග සළකුණ සහිත මාර්ග සන්ධි ස්ථානයකට ළඟාවන බව දැක්වීමට යොදා ඇති සළකුණ

BUS
LANE

103
බස් රථ ධාවන තීරුව

CYCLE
LANE

104
පා පැදි ධාවන තීරුව



105
පා පැදිකරුවන් මාරුවන ස්ථානය

106
මාර්ගයේ අවදානමක් ඇති
බවට අනතුරු හැඟවීමේ රේඛාව

107
බස් රථ හෝ පාපැදි
ධාවන තීරුවක්
වෙන් කර දැක්වීමේ
රේඛාව



108
මං සන්ධි කොටුව



109
මං සන්ධි කොටුව

5. තොරතුරු සංඥා

මග පෙන්වීමේ පූර්ව සංඥා



110



111



112

110 ට විකල්ප සංඥාව



113

බාධක පුවරුව



114

මාර්ගය, නියමිත මාර්ගයෙන් බැහැරව ගමන් කළයුතු
දිසාව ඊතල හිස මගින් දැක් වේ.

විකල්ප බාධක පුවරුව

මග පෙන්වීමේ සංඥා



115

ස්ථානය සහ දුර



116

ස්ථානය සහ වර්ගය

ස්ථාන හඳුනා ගැනීමේ සංඥා



117

නාගරික තදබද ප්‍රදේශයක ආරම්භය



118

නාගරික තදබද ප්‍රදේශයක අවසානය

ස්ථිර කිරීමේ සංඥා



119

දුර ප්‍රමාණයන් ස්ථිර කිරීම

6. පදිකයන් සඳහා ආලෝක සංඥා

රතු පැහැති මිනිසා

කොළ පැහැති මිනිසා



'මාර්ගය ඉඩ දීමේ' ඉර

අ. කණ්නාඩිය බලන්න.
ආ. සංඥාව දක්වන්න.
ඇ. රථය හසුරුවන්න.

මිල : රු. 150/-

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව